ප්‍රධාන ලේකම් කාර්යාලය - උතුරු මැද පළාත - අනුරාධපුර
பிரதான செயலாளர் அலுவலகம் - வடமத்திய மாகாணம் - அநுராதபுரம்
OFFICE OF THE CHIEF SECRETARY - NORTH CENTRAL PROVINCE - ANURADHAPURA

උතුරු මැද පළාත් සභා සංකීර්ණය, 4 වන මහල B, හරිශ්චන්ද්‍ර මාවත, අනුරාධපුරය.
வட மத்திய மாகாண சபை கட்டிடத் தொகுதி. 4ம் மாடி "B" ஹரிச் சந்திரா வீதி, மாவத்த, அநுராதபுரம்.
North Central Provincial Council Complex 4th Floor B, Harischandra Mawatha, Anuradhapura.

ලේකම් / செயலாளர் / Secretary
දුරකථනය / தொ.பே.இல / Tele: 025-2222695
Fax: 025-2224914
විමසීම් / விசாரணை / Inquiries: 025-2235790
E-mail : csncpc@gmail.com

මගේ අංකය / எனது இல. / My No. : NCP/CS/ED/5/7/3
ඔබේ අංකය / உமது இல. / Your No. :
දිනය / திகதி / Date : 2022.06.29

ආයතන චක්‍රලේඛ 2022/01(I)

ආණ්ඩුකාරවර ලේකම් ,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් ,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් ,

**<u>පවතින සම්පත් හිඟය මත රාජ්‍ය වියදම් අවම කර ගැනීම සඳහා රාජ්‍ය ආයතනවල කාර්ය මණ්ඩලය කැඳවීම සීමා කිරීම.</u>**

උක්ත කරුණ මාගේ සමාංක හා 2022.05.31 දිනැති චක්‍රලේඛයට ඔබගේ අවධානය යොමුකරවමි.

02. රජයේ නිලධාරීන් සේවයට කැඳවීම තවදුරටත් සීමා කල යුතු බව 2022/06/26 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 16/2022 (I) හා රාජ්‍ය පරිපාලන ලේකම්ගේ අංක PUB.ADM/SEC/07 හා 2022/06/27 දිනැති ලිපිය මගින් නැවතත් අවධාරණය කර ඇත.

03. එහෙයින් මා විසින් නිකුත් කළ 2022/01 දරණ ආයතන චක්‍රලේඛ ලිපියේ 07 වන වගන්තිය අවලංගු කරන අතර , 05 වන වගන්තිය පහත පරිදි සංශෝධනය කරමි.
" මීට අමතර වශයෙන් කාර්යාල වලට කැඳවන ප්‍රමාණය අතිශයින්ම සීමා කල යුතු අතර , එම ප්‍රමාණය තීරණය කිරීම සහ කැඳවන පිරිස තීරණය කිරීම දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් තීරණය කල යුතුය. එසේම එම ක්‍රමවේදය පිළිබඳව අමාත්‍යාංශ ලේකම්වරයා දැනුවත් කල යුතුය. එසේ වුවද නිලධාරීන් තම කාර්යාලයට නොපැමිනෙන දිනයන් නිවසේ සිට රාජකාරි කරන දිනයක් සේ සැලකිය යුතු අතර යම් නිලධාරියෙකුට සේවයට පැමිණීමට කිසිදු ප්‍රවාහන ක්‍රමයක් නොමැතිනම් ළඟම ඇති කාර්යාලයට අනුයුක්ත කිරීමට කටයුතු කළ යුතුය. "

04. තවද , තම කාර්යාල සිකුරාදා දිනය හැර රාජකාරි කරන ඉතිරි දින හතර විවෘතව තැබිය යුතු බවත් , මාගේ සමාංක හා 2022/06/22 දිනැති ලිපිය මගින් සඳුදා හා බදාදා දිනවල කාර්යාලයේ සියළුම නිලධාරීන් කැඳවීම සඳහා ලබා දී තිබූ නියෝගය මෙයින් අවලංගු කරන අතර , යම් කාර්යාලයක් වසා දැමිය යුතුනම් , එවැනි දිනයන් සඳහා මා මඟින් ගරු ආණ්ඩුකාරතුමා දැනුවත් කළ යුතු බව වැඩිදුරටත් දන්වමි.

එල්.ජේ.එම්.ජී. චන්ද්‍රසිරි බණ්ඩාර,
ප්‍රධාන ලේකම්,
උතුරු මැද පළාත

පිටපත -
01. ආණ්ඩුකාර ලේකම්තුමා - ගරු ආණ්ඩුකාරතුමා සමඟ මේ පිළිබඳව සාකච්ඡා කළ බව ගරු ආණ්ඩුකාරතුමා දැනුවත් කිරීම සඳහා.



| ප්‍රධාන ලේකම් / பிரதம செயலாளர் / Chief Secretary | පාලන / நிர்வாகம் / Administration | පුහුණු / பயிற்சி / Training | මුදල් / நிதி / Finance | සැලසුම් / திட்டமிடல் / Planning | ඉංජිනේරු / பொறியியல் / Engineering | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|---|
| Telephone | 025-2224915 | 025-2235041 | 025-2237430 | 025-2222238 | 025-2220910 | 025-2222736 |